# 2017 නොවැම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"මා ප්‍රේම කරන සියල්ලන්ට තරවටු කර මම ඔවුන් හික්මවමි.
එබැවින් උද්යෝගිමත්ව පසුතැවී සිත් හරවා ගන්න"**

(එළිදරව් 3:19)

මේ නොවැම්බර් මාසය හෙවත් කිතුනු අපට මළවුන්ගේ මාසයයි. අප අතරින් ජීවිතයෙන් සමුගත් අපගේ දෙමව්පිය, සහෝදර සහෝදරියන්, දූ දරුවන්, නෑ දෑ හිතවතුන් වෙනුවෙන් දාන ධර්ම ආදි පුන්‍ය ක්‍රියාවන් ද, ඔවුන්ගේ ආත්ම වෙනුවෙන් යාච්ඤාවන් සහ දිව්‍ය පූජාවන් ඔප්පු කිරීම කිතුනු අපි මේ මාසය පුරාවටම සැදැහැ සිතින් අවධානය යොමු කරමු. එමෙන්ම ජීවත් වන අපත් කවදා හෝ මරණයට පත්වන බව සිහි තබා ගෙන වැඩි වැඩියෙන් දෙවියන් වහන්සේට සමීප වී අපගේ වැරදි අවබෝධ කරගෙන මනස්ථාපනය වී දෙවියන් වහන්සේගෙන් ඈත්වී ලෞකිකත්වයේ මායම් වලට රැවටී සිටින සියළු දෙනා තුළත් සැබෑ සිත් හැරීමක් පතා අපි යාච්ඤා කළයුතු වෙමු.

එමෙන්ම මේ මාසය තුළ අපට මෙනෙහි කිරීමට යොමු කර තිබෙන සුපුවත අනුව දෙවියන් වහන්සේට ප්‍රේම කරන අපට මුහුණ දීමට සිදුවන දුක් ගැහැට, කම්කටොළු සියල්ලම දෙවියන් වහන්සේ අපව හික්මවීම සඳහා දෙන දඬුවම හැටියට සලකා පසුතැවී සිත්හරවා ගැනීමට ශුද්ධාත්ම සහය අපටත්, සමස්ත පුබුදු ජනතාවටත්, කිතුනු ජනතාවටත් අවැසි ශුද්ධාත්ම ආලෝකය පතා අඛණ්ඩව මේ මාසය පුරාවටම සමිඳුන් අභියස පෙනී සිටිමු.

එමෙන්ම අපගේ අයැදීම් සේවාවට සම්බන්ධව සිට දෙව් මව් තුරුලට ගොස් සදාකාලයෙන් සදාකාලයටම දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් මුළු ලෝකය වෙනුවෙන්ම අයදින අපගේ අයදීමේ සේවක සේවිකාවන් අපි ආදරයෙන් සිහි කරමු. ඔවුන්ගේ මැදිහත්කමින් අපගේ සේවාව ඉදිරියට ගෙන යාමට උදව් වෙන්න කියා ඔවුන්ගෙන් ඉල්ලමු.

> "අපි ජීවත්වෙමු නම්, සමිඳාණන් වහන්සේ උදෙසා ජීවත් වෙමු.
> නසිමු නම් සමිඳාණන් උදෙසා නසිමු.
> අපි ජීවිතයෙහිදීත්, මරණයෙහිදීත් සමිඳාණන් වහන්සේගේම වෙමු."
>
> (රෝම 14:8)

| |
|---|
| සමාදානයේ වැජඹේවා !<br>ජාඇල සාංඝිකයේ, තුඩැල්ල ශ්‍රාවක සංඝයට අයත්ව සිට අයැදීමේ සේවාවට සහ පුබුදු සංගීත සේවාවට විශේෂ දූත මෙහෙවරක් කළ කැතරින් ප්‍රනාන්දු අම්මා පසුගිය 12 වන දින ස්වර්ගස්ථ විය. ඇය අඛණ්ඩව ස්වර්ග රාජ්‍යයේ සිට අප වෙනුවෙන් ද, මුළු ලෝකය වෙනුවෙන් ද දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් වෙන බව අපගේ තිර විශ්වාසය යි. එබැවින් ඇයගේ ආත්මය සදා සාමයේ වැජඹේවා යි අපි සමිඳාණන් ඉදිරියේ ප්‍රාර්ථනා කරමු. |

පළමු සතිය : දිව්‍යමය කියවීම - එළිදරව්ව 3:14-21

අයැදීමට විශේෂ යොමුව :

ශුද්ධිකාගිනිස්ථානයේ දුක්විඳින සියළුම ආත්මයණ්ගේ ගැළවීම පතා (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, උපදේශක මණ්ඩලය ඇතුළු පුබුදුව තුළ වගකීම ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මේ මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* මේ මාසයේ 10,11,12 දිනවල ශ්‍රී ප්‍රශංසාරාමයේ පැවැත්වෙන තරුණ කඳවුරට සහභාගි වන සියළුම තරුණයන් සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* මේ මස 11-12 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගි වන සියළු දෙනා සහ උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්.
* මේ මස 12 වන ඉරිදා මීගමු පුබුදු නිවසේ පැවැත්වෙන තරුණි දිනය වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ……

දෙවන සතිය : දිව්‍යමය කියවීම - 1කොරෙන්ති 15:51-58
අයැදීමට විශේෂ යොමුව :

මෙවර ප්‍රශංසාරාමයේ පැවැත්වෙන තරුණ කඳවුරට සහභාගි වන සියළුම තරුණයන් තුළ ශුද්ධාත්ම බලය දැල්වී ඔවුන්ගේ ජීවිත තුළ පෙරළියක් ඇති වීම සඳහා මොර ගසා යාච්ඤා කරන්න.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* මත්පැන්, මත්ද්‍රව්‍ය ඇතුළු විවිධාකාර වහල් බැම්වලට හසු වී සිටින තරුණ තරුණියන් සහ වැඩිහිටියන් වෙනුවෙන්.
* පවුල් දිවියේ අර්බුදවලට මුහුණ පා සිටින සියළු දෙනා වෙනුවෙන්.
* මානසික රෝගීන් වෙනුවෙන්.
* පිලිකා, වකුගඩු සහ ඩෙංගු උවදුරින් පීඩා විඳින සියල්ලන්ට දිව්‍යමය සුවය පතා සහ එවැනි රෝග සහ උවදුරු සම්පූර්ණයෙන්ම තුරන් වන පිණිස.
* ජීවත් වෙතත් මළවුන් මෙන් ජීවත් වන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - 2කොරෙන්ති 4:16-5:10 දක්වා

අයැදීමට විශේෂ යොමුව :

කිතුනු දිවියෙන් ඈත් වී සිටින ප්‍රසාද ස්නාපනය ලැබූ සියළු කිතුනුවන් වෙනුවෙන්.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* මූලධර්මවාදී සභාවලට ගොස් සිටින සියළු කතෝලිකයන් වෙනුවෙන්.
* කිතුනුකම නිසා පීඩා විඳින, මැරුම්කන සියළු දෙනා වෙනුවෙන්.
* මනස්ථාපනය වීමට උවමනා නැති සියළුම පව්කරුවන් වෙනුවෙන්.
* සුබැදි සංඝයට කැඳවීම ලැබෙනු සඳහා
* දුරස්ථර ප්‍රදේශවල සංඝ සහ විදේශ රටවල සියළුම සංඝයන් සහ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - එපීස 6:10-14

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* නොවැම්බර් 25 වන සෙනසුරාදා ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුමැදි මව්වරුන්ගේ රැලිය වෙනුවෙන්.
* නොවැම්බර් 28,29,30 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුරැදි දූවරුන්ගේ ධර්ම විවේකය වෙනුවෙන්.
* අන්ධ, ගොළු, ආබාධිත සියළුම අය වෙනුවෙන්.
* ධීවරයන්, කම්කරුවන්, වඩුවන්, මේසන් වැඩ කරන අය සහ ගාමන්ට්වල සේවය කරන තරුණ තරුණියන් වෙනුවෙන්.
* ඉඩම් ආරාවුල් සහ අසාධාරණයට ලක් වී ඇති සියළුම අය වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

සැලකිය යුතුයි:

මාසයේ සෑම සිකුරාදාවකම අයැදීම් එකතුවලට අයත් සියළුම දෙනා යාච්ඤාවේ දිනයක් හැටියට ගත කරන්න. එදින නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන්ට අවදි වීම, මගේ පැය, දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ පෙනී සිටීමට ප්‍රමුඛතාවයක් දෙන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************